ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# ජාතිය ගොඩනැගීමේ බදු
# (සංශෝධන)

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[220 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## නීතියේ බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) බදු ගෙවීමට යටත් පිරිවැටුම ගණනය කිරීමේ දී ආනයනය කිරීම මත ගෙවනු ලබන නිෂ්පාදන බද්ද ඇතුළත් කිරීම ;

(ආ) නිදහස් කරන ලද බදු ගෙවීමට යටත් පිරිවැටුම රුපියල් පන් ලක්ෂයේ සිට රුපියල් මිලියන තුන දක්වා වැඩි කිරීම ; සහ

(ඇ) විදේශ රැකියාවක නියුක්තව සිට ආපසු පැමිණි යම් තැනැත්තකුගේ යම් නව ව්‍යාපාරයකින් ලැබෙන බදු ගෙවීමට යටත් පිරිවැටුම අවුරුදු පහක කාලයක් සඳහා බද්දෙන් නිදහස් කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ද්‍රව්‍ය සඳහා ප්‍රදානය කරන ලද නිදහස් කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම ; සහ

(ආ) නිදහස් කරන ලද ද්‍රව්‍ය වශයෙන් උපලේඛණයේ 1 වන කොටසට අලුත් අයිතමයන් ඇතුළත් කිරීම සහ නිදහස් කරන ලද සේවාවන් වශයෙන් උපලේඛනයේ II කොටසට අලුත් අයිතමයන් ඇතුළත් කිරීම වේ.

ජාතිය ගොඩනැගීමේ බදු
(සංශෝධන)

එල්.ඩී.ඕ. - 7/2013

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

**1.** මේ පනත 2013 අංක      දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එම පනතේ අදාළ වගන්තිවල ක්‍රියාත්මක වීමේ වෙනත් දිනයන් නිශ්චිතව සඳහන් කර ඇත්නම් මිස, මේ පනත 2013 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2009 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2012 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (iii) ඡේදයේ "එම කාර්තුවේ දී ගෙවන ලද" යන වචන වෙනුවට "2009 පෙබරවාරි මස 01 දින සිට බලපවත්වන පරිදි ආනයනය මත ගෙවන ලද නිෂ්පාදන බදු හැර එම කාර්තුවේ දී ගෙවන ලද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ -

(අ) එහි (iii) වන ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(iii) (iv) ඡේදයේ සඳහන් සේවා හැර, අදාළ කාර්තුව සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීමෙන් ඒ තැනැත්තාගේ බද්දට යටත්වන පිරිවැටුම-

(අ) අදාළ කාර්තුව 2011 ජනවාරි මස 01 දින සිට හෝ එදිනට පසුව ආරම්භ වී 2013 ජනවාරි මස 01 දිනට පෙර වූ යම් කාර්තුවක් වන විට, රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන්නේ නම් ; සහ

(ආ) අදාළ කාර්තුව 2013 ජනවාරි මස 01 දින හෝ එදිනට පසුව ආරම්භවන කාර්තුවක් වනවිට රුපියල් මිලියන තුනක් නොඉක්මවන්නේ නම් ;";

(ආ) එහි (iv ) වන ඡේදයේ "නොඉක්මවන විට" යන වචන වෙනුවට "නොඉක්මවන විට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) එහි (iv) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(v) යම් තැනැත්තෙක්-

(i) 2013 ජනවාරි මස 01 දින හෝ ඉන් පසුව විදේශ සේවා නියුක්තියක යෙදී සිට ආපසු පැමිණ ඇත්නම් ; සහ

(ii) එම ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා තමා ඉපැයූ මුදල් ආයෝජනය කරන්නේ නම් ;

එම කාර්තුව 2013 ජනවාරි මස 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන කාර්තුවක් නම් එම තැනැත්තාගේ බද්දට යටත් වන පිරිවැටුම වනුයේ එම තැනැත්තා විසින් යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ නව ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම හෝ එම තැනැත්තා විසින් සපයනු ලබන සේවාවකින් ලැබෙන පිරිවැටුම වන විට එම තැනැත්තා වාණිජ මෙහෙයුම් ආරම්භ කළ තක්සේරු වර්ෂය ආරම්භයේ සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාලයක් සඳහා;"'

3. 2012 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එම උපලේඛනයේ (I) වන කොටසෙහි -

(අ) (i) අයිතමයේ "නිෂ්පාදකයා" යන වචනය වෙනුවට "නිෂ්පාදකයා" යන වචනය ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (iv) වන අයිතමයේ (iv) ඡේදයේ "එම ද්‍රව්‍යය ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දින සිට අවුරුදු එකක කාලයක් ඇතුළත" යන වචන වෙනුවට "එම ද්‍රව්‍යය ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දින සිට අවුරුදු එකක කාලයක් ඇතුළත හෝ එම ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසුව දින අනූවක කාලයක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එහි (xxxvi) අයිතමයේ "කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 75 බැගින් වූ සෙස් බද්දකට" යන වචන හා ඉලක්කම් වෙනුවට "1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය අනුව වූ සෙස් බද්දකට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඈ) එහි (xxxviii) වන අයිතමයෙහි "කරනු ලබන සිත්තම්." යන වචන වෙනුවට "කරනු ලබන සිත්තම් ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) එහි (xxxviii) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම ඇතුළත් කිරීමෙන් -

"(XXXIX) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද සූර්ය බලශක්තිය උත්පාදනය කිරීම සඳහා වූ සූර්ය බලශක්ති ඒකක, උපාංග හෝ සූර්ය බලශක්ති ගෘහස්ථ පද්ධති ;

(XL) ගල් අඟුරු ;

(XLI) මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ජාත්‍යන්තර ක්‍රීඩා තරගයක් සඳහා ආනයනය කරන ලද ද්‍රව්‍ය ;

(XLII) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 6අ වගන්තියේ (අ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ අනුව විශේෂ සේවා ගාස්තුවකට යටත් වන ආනයනය කරන ලද මැණික් සහ එම මැණික් පසුව පිරිසැකසුම් කල මැණික් වශයෙන් විකිණීම ;

(XLIII) අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, මහජනතාව වෙත සේවය ලබා දීමේ කාර්ය සඳහා යම් පළාත් පාලන ආයතනයක් විසින් සිදු කරනු ලබන කැලි කසල බැහැර කිරීමේ කටයුතු සඳහා භාවිත කිරීමට ආනයනය කරනු ලබන ගලි බවුසර්, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ ;

(XLIV) යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියකට හෝ මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද විශේෂිත ව්‍යාපෘතිකයට හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ලියාපදිංචි වී ඇති සමාගමකට විකුණනු ලබන්නා වූ ද, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනු ලැබූ සමාගමක් විසින් නිෂ්පාදනය කරනු ලැබුවා වූ ද, ද්‍රව්‍යයක් ආනයන ප්‍රතියෝජනයක් ලෙස සලකනු ලබන තාක් දුරට සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ දී එකී ද්‍රව්‍ය සපයන තාක් දුරට එකී ද්‍රව්‍ය ; සහ

(XLV) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා විදුලිබල මණ්ඩලය විසින් හෝ එකී මණ්ඩලය සමඟ විදුලි බලය සැපයීම සඳහා ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් ආයතනයක් විසින් විදුලි බලය උත්පාදනය කිරීමේ කාර්ය සඳහා ආනයනය කරනු ලබන්නා වූ ද රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරනු ලැබුවා වූ ද, මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ.".

(2) එම උපලේඛනයේ (ii) වන කොටසෙහි -

(අ) (xxxvi) වන අයිතමයෙහි "වරායන් සඳහා හෝ ගුවන් යානා සඳහා" යන වචන වෙනුවට "වරායන් සඳහා හෝ ගුවන් තොටුපල සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එහි (xxxiv) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම ඇතුළත් කිරීමෙන් :-

"(xxxv) (422 වන අධිකරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලබන යම් සේවාවක් ; සහ

(xxxiv) පාර්ලිමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලින් සම්මත කර ගනු ලබන අරමුදල්වලින් හෝ ආණ්ඩුව විසින් සලස්වා දෙනු ලබන යම් ණය මුදලකින් යම් රාජ්‍ය සංස්ථාවක් විසින් ආණ්ඩුව වෙනුවෙන් නොමිලයේ ඉටු කරනු ලබන යම් සේවාවක්.".

වගකීමෙන් මුක්ත කිරීම.

**4.** 2013 ජනවාරි 01 දිනයෙන් ආරම්භ ව සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන සහ 5 වන වගන්ති යටතේ අවස්ථාවෝචිත පරිදි දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මෙම පනතේ විධිවිධානවල දක්වා ඇති බදු මුදලක් මෙම පනත අදාළ වන යම් තැනැත්තකුගෙන් එකතු කරනු ලබන අවස්ථාවක දී ඒ එකතු කිරීම සියලු කාර්යයන් සඳහා වලංගු ලෙස සිදුකර ඇති බව හා කරනු ලබන ලෙසත් සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කිරීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමට එරෙහිව අවස්ථාවෝචිත පරිදි දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.